**සාමාන්‍ය සමය තිස්තුන්වන ඉරුදින** | **දේව ප්‍රකාශන** | 16-11-14

**පළමුවන දේව ප්‍රකාශන** හිතෝපදේශය 31:10-13, 19-20, 30-31

හිතෝපදේශයෙන් ගත් පාඨයෙකි.

**"දේව ගරු බිය ඇති කාන්තාව ගරු පැසසුම් ලබයි."**

සත්ගුණවත් බිරිඳක කොහෙන් සොයාගත හැකි ද? ඇගේ අගය මුතුමැණික්වලට වැඩි ය. සිය සැමියා ඇය කෙරෙහි මුළු විශ්වාසය තබයි. ඔහුට සැප සම්පතින් අඩුවක් නැත. දිවි ඇති තාක් ම ඈ ඔහුට අයහපත නොව යහපත කරන්නී ය. ඈ ලොම් හා හණ සපයාගෙන සතොසින් අත්කම්වල යෙදෙයි.

ඈ ඉද්දට ඇගේ අත් පොවා, දැතින් වවුන්න අල්ලයි. ඇගේ නොමසුරු අත දිළිඳුන් වෙත දිගු කර ඇත. එය යාචකාදීන් වෙත විදහා ඇත. රූසිරිය මායාවකි, රූසපුව පහවන්නකි. එහෙත් දේව ගරුබිය ඇති කතට ගරු පැසසුම් ඇත. ඇගේ වැඩ කටයුතුවල සඵලය වර්ණනා කරන්න.

ඇගේ වැර වීරිය ජනතාවගේ පැසසුමට ලක් කරන්න.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

**පිළිතුරු ගීය**

ගීතාවලිය 128:1-5

**පිළිතුර : සමිඳුන් කෙරෙහි ගරු බිය ඇත්තෝ භාග්‍යවන්තෝ ය.**

**ගීය :** සමිඳුන් කෙරෙහි ගරුබිය ඇති, එතුමන්ගේ මාර්ගයෙහි හැසිරෙන සියල්ලෝ
භාග්‍යවන්තයෝ ය. මන්ද, ඔබේ ශ්‍රම ශක්තියේ ප්‍රතිඵලය ඔබ භුක්ති
විඳින්නෙහි ය.
ඔබ වාසනාවන්ත ය. ඔබට ශුභසිද්ධ වන්නේ ය. ඔබේ බිරිඳ ඔබේ නිවෙස
තුළ පල දෙන මිදිවැලක් මෙන් වන්නී ය.
ඔබේ දරුවෝ ඔබේ මේසය වටා ඔලීව පැල මෙන් වන්නෝ ය.
සමිඳුන් කෙරෙහි ගරුබිය දක්වන්නා මෙසේ ආසිරි ලබන්නේ ය.
සමිඳාණෝ සියොන්හි සිට ඔබට ආශීර්වාද කරන සේක් වා !
ඔබේ මුළු ජීවිත කාලයේ දී ජෙරුසලමේ සුබ සෙත ඔබට දක්නට ලැබේ වා!

**දෙවන දේව ප්‍රකාශනය** 1 තෙසලෝනික 5:1-6

ශුද්ධ වූ පාවුලු තුමන් විසින් තෙසලෝනිකවරුන්ට ලියන ලද පළමුවන හසුනෙන් ගත් කොටසකි.

**"සොරෙකු මෙන් ස්වාමින් වහන්සේගේ දවස**
**පැමිණෙන බව ඔබ ම හොඳ හැටි දන්නහු ය."**

සහෝදරවරුනි, මේවා සිදුවෙන කාලවේලා හා අවස්ථා ගැන ඔබට ලියා එවීම අවශ්‍ය නැත. මන්ද, රාත්‍රියෙහි පැමිණෙන සොරෙකු මෙන් සමිඳාණන් වහන්සේගේ දවස පැමිණෙන බව ඔබ ම හොඳ හැටි දන්නහු ය. "සාමය ඇත. අනතුරක් නැතැ'යි ඔවුන් කියන විට, ගැබිණියකට විළිරුජා පැමිණෙන්නාක් මෙන්, ක්ෂණික විනාශය ඔවුන් පිට පැමිණේ. ඔවුන්ට කිසි ගැළවීමක් නැත.

එහෙත්, සහෝදරවරුනි, ඔබ අන්ධකාරයේ නොසිටින නිසා, ඒ දවස සොරෙකු මෙන් ඔබ වෙත පැමිණීමට හේතුවක් නැත. ඔබ සැම, ආලෝකයේ දරුවෝ ද, දිවා කාලයේ දරුවෝ ද වන්නහු ය. අපි රාත්‍රි කාලයේ වත්, අන්ධකාරයේ වත් දරුවෝ නොවන්නෙමු. ඒ නිසා අපි, අන් අය මෙන් නිදා නොසිට අවදි ව, සිහිකල්පනාව ඇතිව සිටිමු.

දේව වාක්‍යය එසේය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

**<u>සුපුවත් ජය නද</u>** ජුවාම 15:5,4

ආලේලූයා ! ආලේලූයා !
"මිදිවැල මම ය. ඔබ අතු ය.
ඔබ මා හා ඒකාබද්ධ නොවන්නහු නම්,
එල දරිමට නොහැකි'යි සමිඳුණෝ වදාරන සේක.
ආලේලූයා !

**<u>ශුද්ධවූ සුවිශේෂය</u>** මතෙව් 25:14-30, හෝ 14, 15, 19, 21

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**"ඔබ ස්වල්පයක් ගැන විශ්වාසී වූ හෙයින්**
**ස්වාමියාගේ ප්‍රීතියට සහභාගී වන්න."**

"ස්වර්ග රාජ්‍යය මෙසේ උපමා කළ හැකි ය. එක් මිනිසෙක් සිය දාසයන් කැඳවා, තමා සතු දේ ඔවුන්ට භාර දී පිටරට බලා ගියේ ය. ඔහු එකිනෙකාගේ හැකියාව අනුව, එක් කෙනෙකුට රිදී කාසි පන්දාහක් ද තව කෙනෙකුට දෙදාහක් ද, තව කෙනෙකුට එක් දාහක් ද බැගින් දී, තමා යන ගමන ගියේ ය. (රිදී කාසි පන්දාහ ලැබූ තැනැත්තේ වහා ම ගොස් එයින් වෙළෙඳාම් කොට තවත් රිදී කාසි පන්දාහක් උපදවා ගත්තේ ය. එලෙස ම රිදී දෙදාහ ලැබූ තැනැත්තේ ද තවත් දෙදාහක් උපදවා ගත්තේ ය. එහෙත් දාහක් ලැබූ තැනැත්තේ ගොස්, පොළොවේ වළක් හාරා, ස්වාමියාගේ මුදල සඟවා තැබී ය.)

බොහෝ කලකට පසු ඒ දාසයන්ගේ ස්වාමියා අවුත් ඔවුන් සමග ගණන් හිලව් බැලී ය. රිදී කාසි පන්දාහ ලැබූ තැනැත්තේ තවත් රිදී කාසි පන්දාහක් ගෙනවුත්, "ස්වාමීනි, ඔබ මට රිදී කාසි පන්දාහක් භාර දුන්නෙහි ය. මෙන්න, තවත් රිදී කාසි පන්දාහක් උපදවා ගතිමි'යි කී ය. ඔහුගේ ස්වාමියා ඔහුට කතා කොට, "යහපත්, විශ්වාසී දාසය, ඉතා අගෙයි, ඔබ ස්වල්පයක් ගැන විශ්වාසී වූ බැවින් බොහෝ දේ කෙරෙහි අධිපති කරමි. ඔබ දැන් අවුත් ඔබේ ස්වාමියාගේ ප්‍රීතියට

සහභාගි වන්නැ'යි කී ය. (රිදී කාසි දෙදාහක් ලැබූ තැනැත්තේ ද අවුත්, 'ස්වාමීනි, ඔබ රිදී කාසි දෙදාහක් මට භාර දුන්නෙහි ය. මෙන්න, තවත් රිදී කාසි දෙදාහක් උපදවා ගතිම්'යි කී ය. ඔහුගේ ස්වාමියා ඔහුට කතා කොට, 'යහපත්, විශ්වාසී දාසය, ඉතා අගෙයි, ස්වල්පයක් ගැන ඔබ විශ්වාසී වූ බැවින් බොහෝ දේ කෙරෙහි ඔබ අධිපති කරමි. ඔබ දැන් අවුත් ඔබේ ස්වාමියාගේ ප්‍රීතියට සහභාගි වන්නැ'යි කී ය. ඉන්පසු රිදී කාසි එක් දහක් ලැබූ තැනැත්තේ ද අවුත්, 'ස්වාමීනි, ඔබ නොවපුළ තැනින් කපන, වගා නොකළ තැනින් පල රැස් කරන, තදහිතක් ඇති මනුෂ්‍යයෙකු බව දැනගතිමි. එබැවින් මම බියෙන් ගොස් ඔබගේ රිදී කාසි පොළොවේ වළක සඟවා තැබීමි. මෙන්න, ඔබ සතුදේ'යි කීය. ඔහුගේ ස්වාමියා ඔහුට උත්තර දෙමින්, "කම්මැලි කපටි දාසය, මා නොවපුළ තැනින් කපාගන්නා බවත්, වගා නොකළ තැනින් පල රැස් කරගන්න, බවත් ඔබ දැන සිටියෙහි ද? එසේ නම්, මාගේ මුදල බැංකුවේ තැන්පත් කළ යුතු ව තිබුණේ ය. එසේ කෙළේ නම්, මා ආ විට මගේ මුදල පොළියත් සමග ලබාගන්න පුළුවන්කම තිබිණි. එබැවින් ඒ රිදී කාසි ඔහුගෙන් ගෙන රිදී කාසි පන්දාහ ඇති තැනැත්තාට දෙන්න. යමක් ඇති තැනැත්තාට දෙනු ලැබේ. ඔහුට පමණටත් වඩා ලැබේ. යමක් නැති තැනැත්තාගෙන් ඔහුට ඇති ටිකත් ගනු ලැබේ. මේ පලක් නැති දාසයා පිටත අන්ධකාරයට නෙරපාදමන්න. එහි දී වැලපීමත් දත්මිටි කෑමත් වන්නේ ය'යි කියනු ඇත.")

සමිඳුණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.lk/ වෙත පිවිසෙන්න.